# 11

# පුද්ගල විසමතා සහ කර්මය

පාසලේ අප කා හටත් පසුගිය සතිය සංවේගජනක වූයේ ය. එයට හේතුව වූයේ අප සමග ඉගෙනුම ලැබූ යහළුවකුගේ හදිසි වියෝවීමයි. ඩෙංගු රෝගය වැළඳීම නිසා මිය ගිය මිතුරා ගැන පාසලේ සියල්ලෝ සැබැවින් ම දුක් වූහ. මියගියේ අපේ පන්තියේ සොහොයුරකු නිසා අපි බොහෝ දුක් වුණෙමු. කිසිවකුටවත් හිරිහැරයක් නොකර සිටිය අයකු ළමා වියේ දී ම මෙසේ මියගියේ ඇයි ද යන්න අප කාටත් ප්‍රශ්නයක් විය. බොහෝ දෙනා මේ ගැන සාකච්ඡා කළහ. ඒ අනුව මිය ගිය අපේ මිතුරා වෙනුවෙන් පාසලේ දී ධර්ම දේශනාමය පින්කමක් කොට පින් අනුමෝදන් කිරීමට අපි තීරණය කළෙමු.

පන්තිභාර ගුරුතුමිය ධර්ම දේශනය සඳහා වැඩම කළ ස්වාමීන් වහන්සේගෙන් මෙවැනි ඉල්ලීමක් කළා ය. "ස්වාමීන් වහන්ස, පන්තියේ හොඳට හිටිය දරුවකු මෙසේ හදිසියේ මියගියේ ඇයි ද කියා ධර්මානුකූල ව පහදා දෙන්න පුළුවන් නම් හොඳයි." ඒ අනුව ස්වාමීන් වහන්සේ අපට කර්මය ගැන ඉතා වටිනා ධර්ම දේශනාවක් කළ සේක. ගුරුතුමියගේ නියමය පරිදි අපි ධර්ම දේශනාව ශ්‍රවණය කරන අතර වැදගත් කරුණු සටහන් කර ගත්තෙමු. ධර්ම දේශනාවෙන් අනතුරුව මියගිය මිතුරා වෙනුවෙන් පිරිකර පූජාකොට පින් අනුමෝදන් කළෙමු. එදා ස්වාමීන් වහන්සේ කළ ධර්ම දේශනාව පාදක කර ගනිමින් ලිපියක් සකස් කරන ලෙසට ගුරුතුමිය අපට දැනුම් දුන්නා ය. ඒ අනුව ස්වාමීන් වහන්සේ සිදු කළ ධර්ම දේශනාව අපි මෙසේ පෙළ ගැස්සුවෙමු.

කර්මය යනු ක්‍රියාවයි. බුදුදහම අනුව ඉන් අදහස් වන්නේ සචේතනික ක්‍රියාවයි. එසේ නැති නම් හිතාමතා කරනු ලබන ක්‍රියාවයි. මිනිස්සු හිතාමතා හොඳ දේ කරති. යහපත් ක්‍රියා සිදු කරති. එසේ ම නරක දේ ද කරති. අයහපත් ක්‍රියාවල නිරත වෙති. නරක ක්‍රියා නරක ප්‍රතිඵල ඇති කරයි. මරණින් මතු දුගතියක ඉපදීමට මග සලසයි. බුදු දහමෙහි පාපය, අකුසලය ලෙස දක්වෙන්නේ නරක ක්‍රියාවන් ය. එබඳු ක්‍රියාවන් මරණින් මතු දුගතිගාමී වීමට මෙන් ම සසර බෙහෝ දුක් විපාක ලබා දීමට ද මුල් වන්නේ ය.

හොඳ ක්‍රියා හොඳ ප්‍රතිඵල උදා කරයි. සුගතියක ඉපදීමට උපකාරී වෙයි. බුදු දහමෙහි එබඳු හොඳ ක්‍රියා හඳුන්වන්නේ පින, කුසලය යනාදී වචනවලිනි. මෙසේ චේතනාව මුල් කොට ගත් යහපත් හා අයහපත් ක්‍රියාදාමයන් කර්ම නම් වේ. මිනිස්සු තිදොරින් ම කර්ම රැස් කරති. එනම් සිතින් කයින් හා වචනයෙනි. මෙසේ දුක් විපාක දෙන නරක

කර්ම මෙන් ම සැප විපාක දෙන හොඳ කර්ම ද ඇත. එබඳු දුක් - සැප විපාක කර්මය තුළින් උපදනා බැවින් පුනර්භවයක් ද ඇත. එනම් දුගතියක හෝ සුගතියක නැවතත් ඉපදීමයි. එය සිදු වන්නේ කර්මානුරූපව ය. හොඳ නරක ක්‍රියාවලට අනුව ය. එසේ නැවත නැවතත් ඉපදෙමින් මිය යමින් සිදුවන පැවැත්ම සංසාරය නම් වේ. සාංසාරික සත්ත්වයා, පුනර්භවයට හිමිකම් ඇත්තෙකි. එනම් නැවත නැවතත් සසර කර්මානුරූපව ලැබෙන ස්කන්ධ පටිපාටිය ඇත්තෙකි.

කවර වයසක දී වුව ද කෙනකුගේ ජීවිතය නිම වීම සසර පැවැත්මෙහි ස්වභාවයයි. එහෙත් මරණයෙන් ජීවිතය කෙළවර නොවේ. නැවත ඉපදී නැවත මිය යයි. මෙය චක්‍රයක් මෙන් සිදු වේ. නිර්වාණාවබෝධය ලබන තෙක් මෙය මෙසේ සිදු වේ. මේ අතර අප රැස් කරන කුසල් අකුසල් අනුව, පින් පව් අනුව, අපට සැප දුක අත් වේ. සසර අප සිතන, කතා කරන දේ මෙන් ම ක්‍රියාත්මක කරන දේ අනුව විපාක ලැබෙයි. අප කරන හොඳ ක්‍රියාවන්ට සැප විපාක ලැබෙන අතර අප සිදුකරන නරක ක්‍රියාවන්ට දුක් විපාක විඳීමට සිදු වේ. මෙය අප කැමැති වුවත් අකැමැති වුවත් සිදුවන බව මතක තබා ගත යුතු ය.

මෙලොව ජීවත් වන මිනිසුන් පිළිබඳ ව විමසා බැලීමේ දී අපට පෙනී යන්නේ කිසි ම කෙනකු තවත් කෙනකුට සමාන නොවන බවයි. හැඩරුවෙන් ද ගතිගුණවලින් ද සත්ත්වයෝ සපුරා සමාන බවක් නොපෙන්වති. මේ පිළිබඳ ව විමසන විට මෙසේ වූයේ මන් දැ යි, කෙනකු ප්‍රශ්න කරනවා ඇත. සමහර ආගම්වල ඉගැන්වීම අනුව එය දෙවියන් වහන්සේගේ කැමැත්ත වේ. පුද්ගල විසමත්වය සිදු ව ඇත්තේ අදෘශ්‍යමාන බලවේග යක් නිසා නොව තමන් විසින් සිදුකරනු ලැබූ අතීත කර්මවල විපාක අනුව බව බුදුසමය පෙන්වා දෙයි.

බුදුරජාණන් වහන්සේ කර්මය පිළිබඳ කළ එක් ප්‍රකට දේශනාවක් මෙසේ ය.

"චේතනාහං භික්ඛවේ කම්මං වදාමි.
චේතයිත්වා කම්මං කරෝති. කායේන වාචාය මනසා"

"මහණෙනි, මම චේතනාව කර්මය යැයි කියමි.
සිතින් සිතා, කයෙන්, වචනයෙන් මනසින් කර්ම සිදුකරයි."

බුදුදහමට අනුව කර්මය කුසල කර්ම හා අකුසල කර්ම කියා කොටස් දෙකකට බෙදිය හැකි ය. ඒවා ද සිතින් සිදුවන කුසල කර්ම, කයින් සිදුවන කුසල කර්ම, වචනයෙන් සිදුවන කුසල කර්ම කියා තුනකටත්, සිතින් සිදුවන අකුසල කර්ම, කයින් සිදුවන අකුසල කර්ම, වචනයෙන් සිදුවන අකුසල කර්ම කියා තුනකටත් බෙදේ. මේ කුසලාකුසල කර්ම නිසා සසර දික් වේ. නැවත නැවත මැරි මැරී උපදියි. නැවත ඉපදීමට අප පුනර්භවය යැයි කියමු. රහත් වන තුරු ම අපි සසර ගමන් කරමු. පුබ්බේ නිවාසානුස්සති ඤාණය හෙවත්

පෙර පැවැත්ම දැකීමේ නුවණ හා චුතූපපාත ඥාණය හෙවත් සත්ත්වයාගේ මතු පැවැත්ම දකින නුවණ ඇති අය පුනර්භවය අත්දැකීමෙන් ම දැන දැක ගනිති. ඒ අනුව සසර උපදින සත්ත්වයාට පෙර කරන ලද කර්මවලට අනුව විපාක විඳීමට සිදුවන්නේ ය.

මේ පිළිබඳ ව විමසා බැලීමේ දී චුල්ලකම්ම විභංග සූත්‍රය කදිම නිදසුනකි. දිනක් බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩවසන විට උන් වහන්සේ හමුවට එන තෝදෙය්‍ය පුත්‍ර සුභ නම් තරුණයා බුදුරජාණන් වහන්සේගෙන් මෙලොව අපට දක්නට ලැබෙන විසමතා 14 ක් පිළිබඳ කරුණු දක්වා ඒවාට හේතුව කුමක් ද යි විමසීය. එලෙස ඔහු විමසනු ලැබූ පුද්ගල විසමතා අදත් අප අතර දක්නට ලැබේ. එම විසමතා මෙසේ දැක්විය හැකි ය.

01. අඩු ආයුෂ ඇති අය (අප්පායුකා)

02. දීර්ඝායුෂ ඇති අය (දීඝායුකා)

03. බොහෝ ආබාධ ඇති අය (බහු ආබාධා)

04. අල්ප ආබාධ ඇති අය (අප්පාබාධා)

05. අවලස්සන අය (දුබ්බණ්ණා)

06. ලස්සන අය (වණ්ණවන්තා)

07. යසස් නැති අය (අප්පේ සක්ඛා)

08. යසස් ඇති අය (මහේසක්ඛා)

09. අල්පභෝග ඇති දුප්පත් අය (අප්ප භෝගා)


10. මහත් වූ භෝග ඇති පොහොසත් අය (මහා භෝගා)

11. පහත් යැයි සම්මත අය (නීච කුලීනා)

12. උසස් යැයි සම්මත අය (උච්චා කුලීනා)

13. නුවණින් අඩු අය (දුප්පඤ්ඤා)

14. නුවණින් යුත් අය (පඤ්ඤාවන්තා)



මෙම කරුණු ඉදිරිපත් කරන සුභ විමසා සිටින්නේ මෙම විසමතාවලට හේතු මොනවා ද යන්නයි. එම පැනයට පිළිතුරු දෙන බුදුරජාණන් වහන්සේ **මානවකය, සත්ත්වයෝ කර්මය ස්වකීය කොට ඇත්තාහ. කර්මය දායාද කොට ඇත්තාහ. කර්මය කරණ කොට ඇත්තාහ. කර්මය නෑදෑකොට ඇත්තාහ. කර්මය පිළිසරණ කොට ඇත්තාහ. කර්මය නිසා මේ පුද්ගලයන්ගේ හීන බව හා උසස් බව ඇති** වේ යයි බව පැහැදිලි කළ සේක.

එහෙත් මෙම පිළිතුරින් සෑහීමකට පත්නොවන සුභ මෙම කාරණා විස්තර කරදෙන ලෙස ඉල්ලා සිටියේ ය. එහි දී බුදුරජාණන් වහන්සේ මෙම විසමතාවලට හේතු පැහැදිලි කළ සේක. එම පැහැදිලි කිරීම් සංක්ෂිප්ත කොට මෙසේ දැක්විය හැකි ය. මෙහි දී අප අද සිදුකරනු ලබන කර්මය හා ඊට ලැබෙන විපාකය වටහාගැනීම පහසු වෙයි.

| | අප විසින් සිදුකරනු ලබන ක්‍රියාව | ඒ අනුව ලැබෙන ප්‍රතිඵලය |
|---|---|---|
| 01 | ප්‍රාණඝාතය කරන්නා<br>(සතුන් මරන්නා) | අඩු වයසින් මිය යයි.<br>(අල්පායුෂ වේ.) |
| 02 | ප්‍රාණඝාතය නොකරන්නා<br>(සතුන්ට දයාව දක්වන්නා) | දීර්ඝායුෂ විඳී.<br>(බොහෝ කල් ජීවත් වේ) |
| 03 | සත්ත්ව හිංසාව සිදුකරන්නා<br>(සත්ත්වයින්ට පහර දෙන්නා) | බොහෝ ආබාධ සහිත ව උපදී.<br>(රෝගියෙකු වී උපදී) |
| 04 | සත්ත්ව හිංසාව නොකරන තැනැත්තා<br>(සත්ත්වයින්ට සලකන තැනැත්තා) | ආබාධ රහිත ව උපදී.<br>(නීරෝගී ව උපදී) |
| 05 | ද්වේෂයෙන් කටයුතු කරන්නා<br>(තරහ ගන්නා තැනැත්තා) | දුර්වර්ණ ව උපදී.<br>(විරූපී ව උපදී) |
| 06 | ද්වේෂයෙන් තොර ව කටයුතු කරන්නා<br>(තරහ නොගන්නා තැනැත්තා) | වර්ණවත් ව උපදී.<br>(රූමත් ව උපදී) |
| 07 | අන් සැපතට ඊර්ෂ්‍යා කරන්නා<br>(අන් සැපත දැක සතුටු නොවන්නා) | අල්පේශාක්‍ය ව උපදී.<br>(යසස් නැති ව උපදී) |
| 08 | අන් සැපතට ඊර්ෂ්‍යා නොකරන්නා<br>(අන් සැපත දැක සතුටු වන්නා) | මහේශාක්‍ය ව උපදී.<br>(යසස් ඇති ව උපදී) |
| 09 | තමා සතු කිසිවක් අන් අයට නොදී භුක්ති විඳින්නා<br>(දන් නොදෙන්නා) | අල්පභෝගී ව උපදී.<br>(දුප්පත් ව උපදී) |
| 10 | තමා සතු දේ හෝ අන් අයට දෙන තැනැත්තා<br>(දන් දෙන්නා) | මහාභෝගී ව උපදී.<br>(පොහොසත් ව උපදී) |
| 11 | ගරු කළ යුත්තන්ට ගරු නොකරන, පිදිය යුත්තන් නොපුදන අධික මානයෙන් යුත් තැනැත්තා | පහත් යැයි සම්මත කුලවල උපදී. |
| 12 | ගරු කළ යුත්තන්ට ගරු කරන, පිදිය යුත්තන් පුදන මානයෙන් තොර වූ තැනැත්තා | උසස් යැයි සම්මත කුලවල උපදී. |
| 13 | කුසල් මොනවා ද, අකුසල් මොනවා ද සත්‍යය, අසත්‍යය කුමක් ද යි (ධර්මය) පිළිබඳ විමසුමක් නොකරන්නා | ප්‍රඥාව අඩු ව උපදී. |
| 14 | කුසල් මොනවා ද, අකුසල් මොනවා ද සත්‍යය අසත්‍යය කුමක් ද යි (ධර්මය) පිළිබඳ විමසීම් කරන්නා | ප්‍රඥාවන්ත වී උපදී. |

ඉහත දක්වන ලද කර්ම හා විපාක පිළිබඳ විස්තරය සලකා බලා ප්‍රාණඝාතය කරන්නා අඩු වයසින් මිය යන බවටත්, ද්වේෂ කරන්නා අවලස්සන වන බවටත්, දන්දෙන තැනැත්තා පොහොසත් වී උපදින බවටත්, යනාදී වශයෙන් මේ දේ කිරීමෙන් මේ විපාකය ම අත්වෙනවා යැයි අප නිගමනයකට නොපැමිණිය යුතු ය. මන්ද එම ක්‍රියා අතුරින් අකුසල ක්‍රියාව වුව ද ප්‍රබල වූයේ නම් ඔහු හෝ ඇය මරණින් මතු නිරයේ උපදී. සත්ත්ව ඝාතනය කරන්නා ඊළඟ භවයේ දී නරකාදියේ උපදී. එය ප්‍රමුඛ වේ. එසේ නොවී ඔහු හෝ ඇය යම් සත්ත්වයකු ලෙස උපත ලැබුවේ ද, එම තැනැත්තා හෝ තැනැත්තිය අඩු වයසින් මිය යයි.

එසේ ම දන්දෙන තැනැත්තා ඊළඟ භවයේ දී අනිවාර්යයෙන් ම පොහොසත් වී උපදින බවට ද අප නිගමනය නොකළ යුතු ය. සූත්‍ර දේශනාවට අනුව දන්දුන් තැනැත්තා ඊළඟ භවයේ දී දෙව්ලොව උපදී. එසේ නොවූයේ නම් ඔහු හෝ ඇය උපත ලැබූ ආත්ම භවයේ දී පොහොසත් වී උපදී. එමෙන් ම සෙසු කර්මයන්ගේ විපාක ද සිදුවන බව දත යුතු ය. ඉහත දක්වන ලද ක්‍රියා අතුරින් අකුසල ක්‍රියා සිදුකළ තැනැත්තාට නරකය ද යහපත් ක්‍රියා සිදු කළ තැනැත්තාට දෙව්ලොව සැපත ද හිමි වේ.

අප මිතුරා මේ ආත්ම භාවයේ දී ඉතා යහපත් ජීවිතයක් ගත කළ ද පෙර ආත්මභාවයන්හි දී සත්ත්ව ඝාතනය කළා විය හැක. ඒ හේතුව නිසා මේ ආත්මභාවයේ දී දීර්ඝායුෂ විඳීමට හැකියාවක් නොලැබෙන්න ට ඇත. මෙබඳු සිද්ධි ඇසුරෙන් කර්ම විපාක පිළිබඳ අප අවබෝධයෙන් යුතු ව කටයුතු කළ යුතු ය.

ඉහත දක්වන ලද කාරණා පිළිබඳ විමසා බැලීමේ දී අපට පෙනී යන්නේ අප පෙර කරන ලද කර්මවල විපාක මෙම ආත්මභාවයේ දී භුක්ති විඳින බවයි. එමෙන් ම මෙලොව දී අප විසින් කරනු ලබන ක්‍රියාවල ඵල විපාක ඉදිරි ආත්මවල දී අපට භුක්ති විඳීමට සිදුවන බවයි. එනිසා අප හැම දෙනා ම යහපත් කර්ම කිරීමට අදිටන් කරගත යුතු ය.

## සාරාංශය

මේ ලෝකයේ ඉපදුණු අපට සැප මෙන් ම දුක් ද විඳීමට සිදු වේ. එය නොපෙනෙන දෙවියකුගේ කැමැත්ත නිසා සිදුවන්නක් නොව අප ලද පූර්ව කර්ම විපාක අනුව සිදුවන්නකි. අද අප සිදුකරන කුසල අකුසල කර්මවල විපාක මේ අත්භවයේ දී හෝ පසු අත්භවයක දී හෝ විඳීමට සිදුවන බව පැහැදිලි ය. සියල්ල කර්මයෙන් සිදු නො වුව ද කර්මය ද ජීවිතයට බලපාන එක් සාධකයකි.

## ක්‍රියාකාරකම

1. චුල්ලකම්මවිභංග සූත්‍රයට අනුව පුද්ගල විසමතා 14 හා ඊට අදාළ විපාක මතකයෙන් කියන්න.
2. දස කුසල් මොනවා ද යි සොයා ඒවා සිතින්, කයින්, වචනයෙන් සිදුවන ආකාරය අනුව කොටස් තුනකට බෙදා දක්වන්න.

## පැවරුම

පන්තියේ ළමයින් කණ්ඩායම් දෙකකට බෙදී එක් කණ්ඩායමක් අප සමාජයේ දක්නට ඇති විසමතා පෙන්වා දෙන්න. අනෙක් කණ්ඩායම ඊට අදාළ කර්ම විපාක කවරේ දැ යි දක්වන්න.